**තිහගොඩ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට **තිහගොඩ** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු කර්මාන්ත ණයගැතියන් රු.7,856,437 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කර්මාන්ත ණය හිමි වෙනුවෙන් රු.8,236,866 ක් අඩුවෙන් ප්‍රතිපාදන සලස්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී සභා භූමියේ ගරාජයක් ඉදිකිරීමට වැය කර තිබූ රු.501,090 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී මෙම අගය ප්‍රාග්ධනිත කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී පෝෂණ මන්දිරය සඳහා මිලදී ගෙන තිබූ රු.124,174 ක් වටිනා උපකරණ තොගය ගිණුම් ගත කර නොතිබුණි. | සියලු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී මෙම අගය ප්‍රාග්ධනිත කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබූ රු.153,159 ක් වටිනා පුස්තකාල පොත් ගිණුම් ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී මෙම අගය ප්‍රාග්ධනිත කරමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේදී සභාවට ආධාර වශයෙන් ලැබී තිබූ රු.191,242 ක් වටිනා ආයුර්වේද බෙහෙත් තොගය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී ගැලපීම් කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 154,331,529 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛන අනුව දැක්වෙන ශේෂ අතර අසමානතා එකතුව රු.1,530,952 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 අවසාන ගිණුමේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.154,520,863 ක් වූ ගිණුම් විෂයයන් 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්‍ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී විස්තරාත්මක උපලේඛනය සහිතව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන)<br>(i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පෙන්වා දෙන ලද වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| | (ii) රීති 204 | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාල අතිරික්ත හා ඌනතා සම්බන්ධව නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පෙන්වා දෙන ලද වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් ආපසු ගෙවිය යුතු රු.2,368,489 ක තැන්පතු ශේෂ නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරිමට කටයුතු කරමි. |
| (ඇ) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පාලන චක්‍රලේඛය. | සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණවල ඉන්ධන දහන පරික්‍ෂාවන් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පෙන්වා දෙන ලද වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,198,354 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,791,829 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,347,500 | 738,024 | 799,906 | 210,483 | 3,180,500 | 569,715 | 544,915 | 272,365 |
| කුලී | 3,105,000 | 2,729,680 | 2,760,481 | 205,453 | 2,710,000 | 3,023,800 | 3,024,050 | 236,254 |
| බලපත්‍ර ගාස්තු | 1,155,900 | 1,119,327 | 1,124,837 | - | 815,800 | 882,251 | 901,671 | 5,510 |
| වෙනත් ආදායම් | 26,687,000 | 19,200,826 | 4,710,189 | 31,729,057 | 17,264,750 | 12,541,886 | 13,910,800 | 17,238,420 |
| **එකතුව** | 33,295,400 | 23,787,857 | 9,395,413 | 32,144,993 | 23,971,050 | 17,017,652 | 18,381,436 | 17,752,549 |

### 2.2.2 කඩ කුලී

-----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ------------------------- |
| ආරම්භක හිගය රු.223,254, ක් වූ අතර, රු.1,067,350 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.1,290,604 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂයේ මුළු අයවීම් රු.1,098,152 ක් වීම නිසා, සමාලෝචිත වර්ෂය අවසානයට රු.192,452 ක් හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | කඩකුලී හිඟ ශේෂය මේ වන විට වාරික වශයෙන් අයකර ගනිමින් පවතින බව හා එසේම ඒ සඳහා නෛතික ක්‍රියාමාර්ගද ගෙන ඇත. |

### 2.2.3 ජල ගාස්තු

------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ------------------------ |
| ආරම්භක හිඟ ශේෂය රු.258,010 ක් වූ අතර රු.337,462 ක් වූ බිල් කිරීම් සමඟ රු.595,472 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයකිරීම රු.399,642 ක් වූයෙන්. වර්ෂය අවසානයට රු.195,830 ක් හිඟයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ජංගම අයකිරීමේ ක්‍රමවේදයක් මගින් හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 වෙනත් ආදායම්

-----------------

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ------------------------- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.983,001 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.30,666,828 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මෙම උසාවි දඩ හා මුද්දර ගාස්තු ශේෂයන් ලබාදෙන මෙන් ලිඛිත ඉල්ලීම් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්ය සාධනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | ------------------------- |
| ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතු නමුත් තිරසාර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකරගැනීමට වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුවේ. | බල ප්රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය හා සෞඛ්‍ය නංවාලීම් සඳහා වන දිගු කාලීන සැලැස්මක් මේ වන විට සභාව විසින් සකසා ඇත. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | ----------------- |
| අංක 1824 හා 2013 අගෝස්තු 16 දිනැති ගැසට්පත්‍රය මගින් තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් බවට ප්‍රකාශ කර අංක 2009 හා 2017 මාර්තු 03 දිනැති ගැසට් පත්‍රය මගින් වර්ග කිලෝමීටර් 4.12 ක් වරිපනම් අයකළයුතු ප්‍රදේශ ලෙස හඳුන්වා දී තිබුණද එම ප්‍රදේශවල සියලු දේපල තක්සේරු කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සියලු දේපල තක්සේරු කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරු කටයුතු අවසන් කිරීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 06 ක් සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත තනතුරු 04 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | ඉදිරියේදි සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 03 දෙනෙකු සහ සෞඛ්‍ය කම්කරුවන් 04 දෙනෙකු ඔවුන්ට නියමිත රාජකාරී වලින් බැහැරව රාජකාරී පවරා තිබුණි. | නියමිත රාජකාරී පැවැරිය යුතුවේ. | සභාවේ තීරණය හා සේවා අවශයතාවය මත ආයතන ප්‍රධානියා විසින් රාජකාරි පවරා ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් ආයතන 12 ක් මගින් පරිසරයට වන හානිය පිළිබඳව අවධානය යොමුවී නොතිබූ අතර, ගාස්තු වශයෙන් රු. 52,800 ක් අයකරගෙන නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුවේ | ආයතන පිළිබද ක්‍ෂෙත්‍ර පරික්ෂාවක් සිදු කිරීමටත්, ඒ මත හිඟ ආදායම් අයකර ගැනීමටත් කටයුතු කරමි. |
| (ආ) | අංක 2103 හා 2018 දෙසැම්බර් 21 දිනැති ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් සමීක්‍ෂණය කර නොතිබූ අතර 2020 ජනවාරි 28 වනවිට බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 84 කින් රු.488,025 ක ගාස්තු අයකර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදි අදාල ගාස්තු අය කරමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පරිහරණය කරණු ලබන අක්කර 05 රූඩ් 03 පර්චස් 32.36 ක් වූ ඉඩම් 21 ක් සභාවට පවරාගෙන නොතිබුණි. | සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රදේශීය ලේකම් කාර්යාලය සමඟ එක්ව අවශ්‍ය කටයුතු සිදු කරමි. |

**3.5.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු අක්කර 01 රූඩ් 01 පර්චස් 11.34 ක් වූ ඉඩම් 04 ක් බදු ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |

**3.5.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ධාවනයෙන් ඉවත් කර තිබූ කෘෂ කැබ් රථය සහ ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර සභා භූමියේ ගාල්කර තිබුණි. | අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |

**3.6 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා සේවා වෙනුවෙන් රු.2,347,598 ක් වැය කර තිබුණද සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**3.7 කොන්ත්‍රාත් පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 3/2014 හා 2014 ඔක්තෝබර් 15 දිනැති මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මාර්ග වැඩ සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අනුමත කරන ලද ඒකක මිල ගණන් භාවිතා කළ යුතු වුවද, මාර්ග සංවර්ධනය කිරීමේදී පළාත් ගොඩනැඟිලි අධ්‍යක්ෂගේ මිල ගණන් භාවිතා කිරීම නිසා කර්මාන්ත 29 ක් වෙනුවෙන් රු.169,058 ක් වැඩිපුර ගෙවා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම කර්මාන්ත සියල්ලෙහි රැඳවුම් මුදල් ගෙවීමේදී වැඩිපුර ගෙවා ඇති මුදල අඩුකර ඉතිරි මුදල පමණක් ගෙවීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |